**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1. තත්ත්වාගණනය කළ මතය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

---

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන ලෙජරයේ සමුච්චිත අරමුදල් ගිණුමට වර්ෂයේදී ගිණුම්ගත කළ හර සහ බැර ශේෂයන් අනුව නිවැරදි එකතු බැර ශේෂය රු. 11,146,514 ක් වුවත් රු. 11,557,727 ක් ලෙස දැක්වීමෙන් රු. 411,213 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරිමේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. | සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත හා 2020 වර්ෂයට අදාළව සතිපොළ බදුගත් බදුකරුවන්ගේ ආරක්ෂිත ඇප තැන්පත් ඔවුන්ගෙන් ලැබිය යුතු හිඟ බදු සඳහා හිලව් කිරීමේදී පිළිවෙලින් රු.362,500 ක් හා රු.462,500 ක් ලෙස එකතුව රු.825,000 ක් ආරක්ෂිත ඇප තැන්පත් ගිණුමට සහ සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබීම නිසා සමුච්චිත අරමුදල් ගිණුම රු.825,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරිමේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. | නිවැරදිව ජ'නල් සටහන් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කොවිඩ් රෝගීන් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් වැයකළ රු.100,000 ක් දකුණු පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කරන බවට දන්වා තිබියදීත් වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු. 100,000 ක් වැඩියෙන් දැක්වුණි. | අතපසු වීමකින් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කළ බවත්, ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල සහ සංචිත වල එකතුව පිළිවෙලින් රු. 327,969,332 ක් හා රු. 327,598,520 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 370,812 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශේෂ පත්‍රයේ සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ඇතුලත් ගිණුම් ශේෂ එකිනෙකට සමාන විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ශුද්ධ මුදල් ප්‍රවාහයේ විචලනය රු. 4,009,174 ක් විය යුතු වුවත් රු. 3,638,361 ක් ලෙස දැක්වූයෙන් රු. 370,813 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළයෙල කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පත් ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් සඳහා ලද රු. 77,927 ක පොලී ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු සිදු නොකිරීමට නිලධාරීන්ට උපදෙස් දුන්නෙමි. | නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 2,464,807 ක අසමානතා පැවතුණි. | අතපසුවීම් මත වෙනස්කම් සිදු වූ බවත්, අදාළ අඩුපාඩු ඉදිරියේදී නොකිරීමට විෂය නිලධාරින් දැනුවත් කළෙමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,098,417 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 2,205,699 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** හඳුනාගත් පාඩු

------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ලුණුගම්වෙහෙර නව නගරයේ පිහිටි අංක 07 සහ 24 දරණ සහා කඩ කාමර දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො/ 2010/01 දරණ චක්‍රලේඛය පරිදි බදුදීමට සභාව කටයුතු නොකිරීම නිසා අයකර ගැනීමට තිබූ එක්වන් මුදල් රු.400,000 ක් නොසැලකිල්ල මත අහිමි වී තිබුණි. | කඩ කාමර වල සන්තකය පවරා ගැනීමටත්, එක්වන් මුදල් බදුකරු නොගෙවන විට චක්‍රලේඛය නොසලකා රාජකාරි ඉටුකළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ ජල ටැංකි රාමු 30 ක් සැකසීම සඳහා රු. 1,281,000 ක් වැයකර මිලදී ගෙන තිබූ ජල ටැංකි රාමු 30 න් 10 ක් අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන වසරකට වඩා වැඩි කාලයක් කාර්යාලයේ ගබඩා කර තිබුණි. | ඉතිරි යකඩ රාමු කඩිනමින් බෙදාහැරීමට කටයුතු කරමි. | ජල ටැංකි ආදාරක අපේක්ෂිත කාර්යය සඳහා යෙදවිය යුතුය. |